# ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
# ලංකා ධීවර සංස්ථාව
# පුරප්පාඩු

ලංකා ධීවර සංස්ථාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සේවා ගණය : කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන**

**තනතුර : කළමනාකරණ සහකාර ^MA 1-2&**

**සුදුසුකම්**

**බාහිර අපේක්ෂකයින්**

**අධ්‍යාපනික:**

(1) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, සිංහල/ දෙමළ, සහ ගණිතය ද තවත් විෂය දෙකක් (02) ද, ඇතුළු විෂය හතරකට (04) සම්මාන සහිතව, ඉංග්‍රීසි භාෂාව ද ඇතුළත්ව විෂය හයකින් (06) සමත් වීම.

සහ

(2) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් (සාමාන්‍ය දැනුම විෂයය හැර) විෂය තුනකින් (03) සමත් වීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින්**

**සුදුසුකම් ේ:** ප්‍රාථමික - ශිල්පීය නොවන/ ප්‍රාථමික- අර්ධ ශිල්පීය / ප්‍රාථමික- ශිල්පීය යන සේවා ගණ වල සේවය කරන සේවක - සේවිකාවන්ට පහත දැක්වෙන සුදුසුකම් ලබා තිබේනම් අයදුම් කළ හැකි වේ.

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී, සිංහල/ දෙමළ, සහ ගණිතය ද තවත් විෂය දෙකක් (02) ද, ඇතුළු විෂය හතරකට (04) සම්මාන සහිතව, ඉංග්‍රීසි භාෂාව ද ඇතුළත්ව විෂය හයකින් (06) සමත් වීම.

සහ

**(ආ) සේවා පළපුරුද්ද:** ප්‍රාථමික - ශිල්පීය නොවන /ප්‍රාථමික - අර්ධ ශිල්පීය / ප්‍රාථමික - ශිල්පීය යන සේවා ගණවල අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා පළපුරුද්දක් හා තනතුරේ ස්ථිර කර තිබෙන සේවකයකු / සේවිකාවක වීම.

**සටහන : පිළිගත් ආයතනයකින්, පරිගණක භාවිතය පිළිබඳව හදාරා තිබෙන බවට සහතිකයක් ලබා තිබීම, අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.**

වැටුප **: MA 1-2 - 2025 Rs. (46,220-10 × 540-07 × 630-12× 1,080-12× 1,280-84,350)**

**රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් දීමනා ද හිමි වේ.**

**වෙනත් ප්‍රතිලාභ**

1) සේවක අර්ථසාධක අරමුදල් වෙනුවෙන් වැටුපෙන් අඩු කර ගන්නා 10% දායක මුදල සඳහා සංස්ථාව මඟින් 15% දායක මුදලක් බැර කරනු ලැබේ.
2) සේවක භාරකාර අරමුදල සඳහා සංස්ථාව 3% ක ප්‍රදානයක් බැර කරනු ලැබේ.
3) රජයේ චක්‍රලේඛ අනුව ප්‍රවාහන පහසුකම්/හෝ දීමනා

**පොදු කොන්දේසි**

(අ) අපේක්ෂකයින්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අයවිය යුතු වේ.
(ආ) රාජ්‍ය ආයතනයක/සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක අයදුම්කරුවන් ස්වකීය අයඳුම්පත් අදාල ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.
(ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ඈ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු වේ.

සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ ජීව දත්ත තොරතුරු (CV) හා අදාල අධ්‍යාපන සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ සහතික පත්ද සමඟ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන් සහිතව **2025.09.15** දිනට හෝ ඊට ප්‍රථම තනතුරේ නම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර මා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (E mail : chairman@cfc.gov.lk)

සභාපති
ලංකා ධීවර සංස්ථාව
නො 15, රොක් හවුස් පටුමග
කොළඹ 15.
දුරකථන අංක ( 0112-540455